**<u>රත්නපුර මහා නගර සභාව</u>**

**<u>රත්නපුර දිස්ත්‍රික්කය</u>**

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය 2014 අප්‍රේල් 03 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 08 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 22 දින සභාවේ නගරාධිපතිවරයාට යවා ඇත.

1.2 මතය ව්‍යාචනය
-------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
----------------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිත අංක 01 හි 21 ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු පහත සඳහන් ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

(i.) මුදල් ප්‍රවාහ ප්‍රකාශය.

(ii.) අයවැයගත සංඛ්‍යා හා සත්‍ය සංඛ්‍යා අතර සන්සන්දනාත්මක ප්‍රකාශනයක් හෝ මූල්‍ය ප්‍රකාශන වල අයවැයගත සංඛ්‍යාවන් වෙනම තීරුවක් ලෙස දැක්වීම.

(iii.) වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය.

(iv.) ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු දේපල බදු දීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල අවම ප්‍රදාන මුදල රු. 85,153,396 ක් වන අතර, රු. 83,944,496 ක් පමණක් ආදායම් ලෙස දක්වා රු. 1,321,400 ක් වූ වෙනස විවිධ තැන්පතු යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂ වල සිට අවම ප්‍රදාන මුදල් වශයෙන් ලද රු. 100,706,846 ක් අදාල වර්ෂ වලදී ආදායමට නොගෙන විවිධ තැන්පතු යටතේ ගිණුම්ගත කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයේදී ඉදිරියට ගෙනඑනු ලබන විවිධ තැන්පත් ශේෂය තැන්පත් ලේඛණයේ ශේෂයට වඩා රු. 82,665,276 ක් අඩුවෙන් ගිණුමේ දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව ඔක්තෝබර් මාසය දක්වා හඳුනාගෙන ඇති තානායම් කුළී රු. 1,147,387 ක් හා හිඟ ආදායම් හඳුනාගෙන සමාලෝචිත වර්ෂයේ ආදායම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාලව පැරණි බස්නැවතුම්පල කඩකුලී ආදායම රු. 1,021,406 ක් වුවද, වර්ෂයේ ලැබීම් රු. 936,289 ක් පමණක් ආදායම් වශයෙන් ගිණුම්ගත කිරීමෙන් රු. 85,117 ක ආදායම් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන මඟින් සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුමේ සමස්ථ ප්‍රතිඵලය මඟින් රු. 23,582,654 ක අතිරික්තයක් පැවතියද, සමුච්චිත අරමුදල් ගිණුමට ගලපා තිබුණේ රු. 16,251,538 ක් පමණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු දේපල ණය පොළී ආදායම රු. 86,838 ක් වුවද, රු. 1,290,152 ක් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු. 415,600 ක් හා වර්ෂය අවසානයේ ලැබිය යුතු ශේෂය රු. 802,415 ක් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් වී නොතිබුණි.

(ඌ) ව්‍යාපාර බලපත්‍ර නිකුත් කල යුතු ආයතන හඳුනාගෙන ලේඛණගත කර එම ආයතන සඳහා ව්‍යාපාර බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදයක් නොතිබූ අතර, ආදායම රු. 1,800,396 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි. තවද, 2012 වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂයේදී ලැබුණු රු. 252,000 ක් වර්ෂයේ ආදායම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

(එ) ඉකුත් වර්ෂය වෙනුවෙන් ලද මුද්දර ගාස්තු ආදායම රු. 20,200,306 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් වශයෙන් ගිණුම්ගත කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු රු. 11,098,522 ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු. 21,192,393 ක් වුවද, වරිපනම් බදු ලෙජර් ගිණුම අනුව එම ශේෂය රු. 21,335,707 ක් වූයෙන් වරිපනම් බදු ණයගැති වටිනාකම රු. 143,314 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුම අනුව වරිපනම් බදු ආදායම රු. 34,095,797 ක් දක්වා තිබුණද, වරිපනම් අංශයේ සත්‍ය ආදායම රු. 26,000,125 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 8,095,672 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඕ) පසුගිය වර්ෂ වල සිට ආදායම් හා වියදම් ගිණුමේ ගලපා නොතිබූ සැලසුම් කමිටු පෙරසැරි ගාස්තු, අනවසර සේවා ගාස්තු ආදායම් සහ පෙරසැරි ගාස්තු ගිණුමේ වියදම් සමාලෝචිත වර්ෂයට අදාලව ලද, පිළිවෙලින් රු. 975,150 ක් හා රු. 133,000 ක් ආදායමට ගෙන නොතිබූ අතර, සමාලෝචිත වර්ෂයට අදාලව පෙරසැරි ගාස්තු ගිණුමේ වියදම් රු. 191,000 ක්ද, වියදමට ගලපා නොතිබුණි. එම ගිණුම් වලට අදාලව සමාලෝචිත වර්ෂයේ අවසානයට පැවති ශේෂ පිළිවෙලින් රු. 3,497,529 ක් හා රු. 518,645 ක් ආපසු ගෙවිය යුතු තැන්පත් මුදලක් වශයෙන් ශේෂපත්‍රයේ පෙන්වා තිබුණි.

(ක) ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ ලැබුණු මහජන පොළ ඉදිකිරීමේ ණය මුදල් ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයට රු. 40,361,321 ක් වුවද, ගිණුම අනුව එම ශේෂය

රු. 28,002,506 ක් වූයෙන් ශේෂය රු. 12,358,815 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. මීට අමතරව වර්ෂය තුලදී ගෙවා තිබූ ණය මුදලේ කොටස් මුදල් රු. 5,845,413 ක් හා පොළී මුදල රු. 2,816,843 ක් ද, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් තවදුරටත් ගෙවිය යුතු පොළී රු. 908,130 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ග) ප්‍රවේශ මාර්ගය හා බහුකාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ සමාලෝචිත වර්ෂයට අදාලව ලද රු. 3,658,113 ක් වන සියයට 40 ක ප්‍රදාන මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ච) ආසියානු සංවර්ධන බැංකු ණය ව්‍යාපෘති අංක 1632 SRI(SF) යටතේ රත්නපුර මහා නගර සභා බල ප්‍රදේශයේ මාර්ග වැඩිදියුණු කිරීම සඳහා වූ රු. 12,656,450 ක ණය මුදලට අදාලව සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු රු. 7,655,794 ක පොළී මුදල වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ජ) සේවක ණය ලේඛණය අනුව සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ ණය රු.11,046,045 ක් වූ අතර, ආපසු අයකර ගැනීම් රු.8,845,730 ක් විය. සේවක ණය පාලන ලෙජර් ගිණුම අනුව ගෙවා තිබූ මුදල රු.12,458,021 ක් ද අයකර ගැනීම් රු.10,280,711 ක්ද, වූයෙන් ගෙවූ ණය රු.1,411,976 ක හා අයකර ගැනීම් රු.1,434,981 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ට) සංවර්ධන ගිණුමට අදාලව සමාලෝචිත වර්ෂයේ රු. 5,232,728 ක් වූ ආදායම්, රු. 7,349,958 ක් ලෙස ගිණුම්ගත කර තිබූ බැවින් රු. 2,117,229 ක ආදායම්, වැඩියෙන් දක්වා තිබුණි.

(ඩ) වෙනත් ආදායම් ලෙස රු. 12,498,355 ක් දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂයට අදාල වෙනත් ආදායම් රු. 15,401,722 ක් වූයෙන් රු. 2,903,367 ක ආදායම් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ණ) වැය ලෙජරය හා ගිණුම සැසඳීමේදී වැය විෂයයන් 64 කට අදාලව රු. 25,108,171 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ත) වැය ලෙජරයේ ඇති වැය විෂයයන් 05 කට අදාල රු. 10,284,390 ක වියදම් වර්ෂයේ වියදම් ලෙස ගෙන නොමැති බැවින් එකී වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ වියදම් අඩුවෙන් පෙන්නුම් කෙරේ.

(ථ) වැය විෂයයන් 08 කට අදාල රු. 553,027 ක වියදම් වැය ලෙජරයේ සටහන්ව නොමැති වුවද, ගිණුමෙහි දක්වා තිබුණි.

(ද) සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු සම්බන්ධයෙන් ණයහිමියන් යටතේ වෙන් කර දක්වා නොතිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ වත්කම් ගිණුම් විෂයයන් 15 කට අදාලව හා වගකීම් ගිණුම් 08 කට අදාලව පාලන ගිණුම අනුව හා උපයෝගී ලේඛණය අනුව පිළිවෙලින් රු. 14,013,241 ක හා රු. 85,516,786 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ ලේඛණය හා ගිණුම අනුව රු. 5,456,300 ක් හා මෝටර් රථ හා කරත්ත ලේඛණ හා ගිණුම අනුව රු. 60,074,217 ක් හා ලී බඩු හා සවිකිරීම් ලේඛණ හා ගිණුම අතර රු. 857,923 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සාරාංශ ආදායම් ලේඛණයේ සඳහන් ආරම්භක හිඟ ශේෂ හා කලින් ලැබීම්, ගිණුම සමඟ ඉදිරිපත් කර ඇති වෙනත් ආදායම් උප ලේඛණය සමඟ සැසඳීමේදී අයශීර්ෂ 17 කට අදාලව හිඟ ශේෂය හා කලින් ලැබීම් වල පිළිවෙලින් රු. 12,904,823 ක් හා රු. 69,893 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.113,993,254 ක වටිනාකමට වූ ලැබිය යුතු ගිණුම් ශේෂ සනාථ කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරින.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට දීර්ඝ කාලයක සිට පැවත එන රු. 8,406,364 ක් වටිනාකමැති වත්කම් හා වගකීම් ශේෂයන් 03 ක් සඳහා එම ගිණුම් ශේෂ සැදුම්ලත් ආකාරය පිළිබඳ තොරතුරු හා දිගුකාලීනව පවතින රු. 300,000 ක ඉන්ධන සඳහා තැන්පතු පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) ගිණුම් අනුව රු. 67,368,392 ක්වූ ණයහිමි ශේෂය තහවුරු කර ගැනීම සඳහා ණයහිමි ලේඛණය විගණනයට ඉදිරිපත් නොවුණි.

1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම්. |
|---|---|---|
| (අ) | 2009 මාර්තු 09 දිනැති අංක 2009/01 පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 1.1 වගන්තිය | මහජන පොළ ඉදිරිපස කඩ සාප්පු 23 ක් බදු දීමේදී ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කර නොතිබුණි. |
| (ආ) | 2010 නොවැම්බර් 16 දිනැති අංක 01/2010 දරණ ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛය | යොමුගත චක්‍රලේඛයට පටහැනිව ආයතනයේ පුරප්පාඩු තනතුරු 116 ක් නිශ්චිතව හඳුනාගත හැකිව තිබියදී එම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු නොකොට සේවා ගිවිසුම් මත සේවකයින් 242 ක් සහ අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 77 ක් සේවයේ යොදවා තිබුණි. |
| (ඇ) | <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය - 1992</u> | |
| (I) | මුදල් රෙගුලාසි 395 | බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ දිගු කාලීන ප්‍රමාදයක් තිබින. |

(II) මුදල් රෙගුලාසි 396 (ඈ) 2006 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ක කාලය ඉක්මවන ලද රු. 811,968 ක්වූ චෙක්පත් 89 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අයහාරය ඉක්මවූ පුනරාවර්ථන වියදම රු. 579,358 ක් වූ අතර,ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ මෙහෙයුම් අයහාරය රු. 17,168,213 ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---------------------------------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ඌනතාවය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 103 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව ආදායම අඩුවීමත් වියදම් වැඩිවීමත් වේ.

2.3 ආදායම් පරිපාලනය
-----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්
-------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 24,475 | 35,481 | 21,192 |
| බදු කුලී | 69,829 | 40,979 | 8,362 |
| බලපත්‍ර ගාස්තු | 4,317 | 1,930 | - |
| වෙනත් ආදායම් | 206,951 | 160,175 | - |

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

-------------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත හා රැස්කල ආදායම සැසඳීමේදී බදු කුළී ආදායම්, බලපත්‍ර ගාස්තු, සේවා සඳහා ගාස්තු සහ වරෙන්තු ගාස්තු හා දඩ වල ඇස්තමේන්තුගත ආදායමට වඩා රැස්කල ආදායමෙහි පිළිවෙලින් සියයට 41, 55, 47 හා සියයට 77 ක අඩුවීමක් පෙන්නුම් කෙරේ.

2.3.3 කඩ බදු

------------

(අ) 2013 දෙසැම්බර් 31 දිනට කඩහිමියන් 123 දෙනෙකුගෙන් රු. 1,920,536 ක මුදලක් අයවීමට තිබුණි.

(ආ) මහජන පොළ ඉදිරිපස කඩ සාප්පු බදුගත් බදු කරුවන් 07 දෙනෙකු විසින් අදාල ප්‍රදාන මුදල් 2013 වර්ෂය තුලදී ගෙවා තිබූ නමුත් විගණිත දිනය වූ 2014 ජුනි 30 දින දක්වා ගිවිසුම් වලට එළඹ නොතිබුණි.

(ඇ) නගරාධිපතිගේ 2013 ජනවාරි 01 දිනැති මහජන පොළ කඩ කාමර බදු දීමේ ලිපියට අනුව රු. 250,000 ක ප්‍රදාන මුදලින් සියයට 50 ක් ගෙවා ඉතිරිය වර්ෂයක කාලයක් තුලදී ගෙවා අවසන් කල යුතු වුවද, විගණිත දිනය වූ 2014 ජුනි 30 දින වනවිට කඩබක්කි 135 කින් අයවිය යුතු ප්‍රදාන මුදල රු. 11,555,800 ක් බව විගණනයේදී නිරීක්ෂණය විය. එම කඩහිමියන්ගෙන් අයවිය යුතු මුදල අයකර ගැනීමට සභාව විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) මහජන පොළ ඉදිරිපස කඩ සාප්පු 23 ක් බදු දීම සඳහා පළකරන ලද පුවත්පත් දැන්වීම් වලට අනුව රු. 20,000 ක මාසික කුළි පදනම මත කඩකාමර ලබා ගැනීමට කැමැත්ත පලකල ටෙන්ඩර්කරුවන් වෙත කඩකාමර ලබා නොදීම හේතුවෙන් බදුකරුවන් 14 දෙනෙකුගෙන් සභාවට ලැබිය යුතුව තිබූ රු.8,400,000 ක ආදායමක් අහිමි වී තිබුණි. තවද, අවස්ථා 04 කදී ටෙන්ඩර් කැඳවීම් කලද, මිල ගණන් ඉදිරිපත් නොවූ කඩකාමර 04 ක් බදු ගැනීමට කැමැත්ත පල කර තිබූ බදුහිමියන් 04 දෙනෙකු සඳහා විධිමත් ක්‍රියාපටිපාටියකින් බැහැරව 2013 මැයි 29 සහ 2013 ජූලි 10 දිනැති සභා තීරණ මත එම කඩකාමර ලබා දී තිබුණි.

2.3.4 ඉඩම් බදු

------------

රජයේ තක්සේරුකරුගෙන් 2011 මාර්තු 14 දින ලබාගත් තක්සේරු වාර්තාවක් මත රුපියල් ලක්ෂ 26 ක මුදලකට කිසිඳු ටෙන්ඩර් කැඳවීමකින් හෝ බදු ගිවිසුමකින් තොරව සභාව සතු පුළුගපිටිය පොදු වැසිකිළිය අසල ඉඩම වර්ෂයක කාලයක් සඳහා පුද්ගලයෙකුට බදු දී තිබුණි. පසුව ප්‍රසිද්ධ ටෙන්ඩර් කිරීමක් සිදුකල බවට ලිපිගොනු සකසා නැවත 81 B, හොලීපිටිය, දොඩම්පේ ලිපිනය සඳහන් ඉහත පළමු බදුකරුගේ බිරිඳට උක්ත තක්සේරුව මත පදනම්ව 2012 දෙසැම්බර් 19 දින රු. 2,611,500 ක මුදලකට බදු දී තිබුණි. අනුකූලතා සහතිකයක් ලබා නොගෙන බව මෙම ඉඩමේ තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අත්තිවාරම් යොදා තිබූ බව 2013 ඔක්තෝබර් 29 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම 2013 මාර්තු සිට දෙසැම්බර් මස දක්වා රු. 11,098,522 ක් ලෙස හඳුනා ගෙන ඇතත්, ආදායම සභාවට අයකර ගැනීමට කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) උසාවි දඩ ආදායම 2012 වර්ෂය සඳහා රු. 342,317 ක් සහ 2013 වර්ෂය සඳහා 415,600 ක් ලෙස හඳුනාගෙන 2014 ජනවාරි 30 දින සභාවට අයකර ගෙන ඇතත්, ගිණුම් මඟින් අදාල ගැලපීම් සිදුකර නොතිබුණි.

2.3. 6 වෙනත් ආදයම්

------------------

මහා නගර සභාව සතු ලක්ෂ්මි සිනමා ශාලාව සඳහා ලැබිය යුතු කුලී ආදායම රු. 551,000 ක් අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී කිසිඳු පියවරක් ගෙන නොමැති අතර, සිනමා ශාලාවද වල් බිහි වෙමින් වසා දමා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ පළමු අර්ධ වර්ෂය වෙනුවෙන් සිමෙන්ති මිලදී ගැනීමේදී සැපයුම්කරුවන්ගේ නාම ලේඛණයේ සඳහන් නොවූ ආයතනයක් මඟින් රු. 2,316,300 ක සිමෙන්ති මිලදී ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී සභාව අවස්ථා 07 කදී රු. 1,432,061 සිට රු. 6,059,060 දක්වා අයිරා පහසුකම් ලබාගැනීම හේතුවෙන්, 2013 දෙසැම්බර් 09 සිට දෙසැම්බර් 30 දක්වා මුදල් පොතෙහි අඛණ්ඩ සෘණ ශේෂයක් දක්නට ලැබුණි.

(ඇ) අංක 72808049 දරණ ලංකා බැංකු ජංගම ගිණුමේ 2012 ජූනි 29 දිනට වූ රු. 64,517 ක ශේෂය වර්ෂ 02 කට වැඩි කාලයක් අක්‍රීයව පැවතුනි.

3.2 විදේශ ගමන්

------------------

(අ) විදේශ සංවිධානය හෝ විදේශ රජය හෝ විදේශ සංචාරය සඳහා වැයවන සියළු වියදම් හා පහසුකම් දැරිය යුතු වුවද 2013 පෙබරවාරි 26 දින සිට 2013 මාර්තු 03 දින දක්වා තායිලන්ත සංචාරය සඳහා සභිකයින් 12 දෙනෙකුට රු. 90,000 බැගින් සභා අරමුදලින් රු.1,080,000ක් වැය කර තිබුණි.

(ආ) 2010 ඔක්තෝබර් 11 දිනැති මු.ක්‍ර.අ. 01/2010/01 දරණ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම් හා භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛයෙහි 2(i) වගන්තිය ප්‍රකාරව විදේශ ගමන් දීමනා හා ඒ ආශ්‍රිත වියදම් ලබා ගැනීම සඳහා විධිමත් පරිදි රාජකාරී නිවාඩු අනුමත කර තිබිය යුතු වුවද, කිසිඳු නිවාඩු අනුමැතියකින් තොරව තායිලන්තයේදී පැවති පුහුණු වැඩමුළුව සඳහා සහභාගී වූ සභිකයින් 12 දෙනෙකු වෙනුවෙන් පුද්ගලික ආයතනයක් වෙත රු. 1,358,100 ක් සභා අරමුදලින් දරා තිබුණි.

(ඇ) 2013 ඔක්තෝබර් 20 දින සිට ඔක්තෝබර් 25 දින දක්වා ඉන්දුනීසියාවේ පවත්වනු ලැබූ පළාත් පාලන ක්‍රමය පිළිබඳ අධ්‍යයන චාරිකාව වෙනුවෙන් සභා අරමුදලින් වියදම් දැරීමට ප්‍රධාන අමාත්‍ය තුමාගේ අනුමැතිය ලැබී තිබූ අතර, ඒ සඳහා එක් සභිකයකු වෙනුවෙන් රු. 173,265 ක් සභා අරමුදලින් වැය කර තිබුණි. තවද, 2014 අගෝස්තු 27 දින වන විට පුහුණුව අවසන් වී මාස 10 ක් ගත වී තිබුණද, ඉන්දුනීසියානු පළාත් පාලන ක්‍රමය සම්බන්ධයෙන් ලබාගත් දැනුම දේශීය වශයෙන් උපයෝගී කරගන්නා ආකාරය පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 29 කට අදාලව රු. 3,382,000 ක මුළු ප්‍රතිපාදන කිසිදු කාර්යයක නොයොදා ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 20 කට අදාලව රු. 6,846,000 ක මුළු ප්‍රතිපාදනයට කිසිදු කාර්යයක නොයොදා වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණි.

(ඇ) වැය විෂයයන් 29 කට අදාලව ප්‍රතිපාදන ඉක්මවා රු. 17,805,838 ක වියදම් දරා තිබූ අතර, ඒ සම්බන්ධයෙන් නිසි අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

4.2 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

------------------------------------------------------

2013 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 33 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම් වලට භාජනය වූ ගනුදෙනු වල ගණනය කළ හැකි වටිනාකම රු. 348,606,901 ක් විය.

5. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය

(ii) ආදායම් පරිපාලනය

(iii) අයවැය පාලනය

(iv) මූල්‍ය පාලනය